# අයවැය පොරොන්දු:
# මැති සබයෙන් ඔබ්බට

**2020** වසර අවසානයේ තක්සේරුව

**2021**

**© Verité Research**

# CONTENTS


**අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට .......... 3**

**ඇගයීම් ක්‍රමවේදය .......... 3**

**1. වියදම් යෝජනා .......... 4**

1.1. විවෘතභාවය ඇගයීම .......... 4

1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම .......... 6

1.3. ප්‍රගතිය මැනීම .......... 7

**2. ප්‍රතිපත්ති යෝජනා ඇතුලත් කැබිනට් තීරණ .......... 8**

2.1. ප්‍රගතිය මැනීම .......... 9

**3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර. .......... 10**

# අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට

**"අයවැය පොරොන්දු: මැති සබයෙන් ඔබ්බට"යනු** 2017 වසරේ සිට වාර්ෂිකව අයවැය කතාවෙහි සඳහන් පොරොන්දු ඉටුකිරීමෙහිලා රජයේ කාර්ය සාධනය වාර්තා කරන publicfinance.lk යටතේ ඇති ඩැෂ්බෝඩයක් වේ

ආණ්ඩුව ඉදිරිපත් කරන වාර්ෂික අයවැය කතාවෙහි අයවැය පොරොන්දු පිළිබඳ මූලික ප්‍රශ්න දෙකකට පිළිතුරු සෙවීම මෙම ඩැෂ්බෝඩයේ මූලික අරමුණ වේ.

(i) රජය ක්‍රියාවට නංවන්නේ පවසන දෙය ද?
(ii) රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙය ද?

මෙම ඩැෂ්බෝඩයේ හරහා ඉහත ප්‍රශ්න වලට පිළිතුරු ජනතාවට ලබා දීමෙහි අරමුණ වන්නේ,

(i) රජයේ අයවැය පොරොන්දු සම්බන්ධව විවෘතභාවය වර්ධනය කිරීම සහ
(ii) අයවැය පොරොන්දු ඉටුකිරීම සම්බන්ධව රාජ්‍ය ආයතනවල වගවීම වර්ධනය කිරීමයි

# ඇගයීම් ක්‍රමවේදය

2020 වසරේ අයවැය කථාවක් නොතිබීම හේතුවෙන්, අයවැය යෝජනා වෙනුවට එම වසරේ ජනවාරි සිට ජූනි දක්වා ගනු ලැබූ වියදම් යෝජනා සහ ප්‍රතිපත්ති යෝජනා ඇතුලත් කැබිනට් තීරණ 24ක් පිළිබඳ කරන ලද විශ්ලේෂණ වල ප්‍රතිපල මෙම ඩැෂ්බෝඩය හරහා ලබා ගත හැක. මෙම තීරණ තෝරා ගනු ලැබුවේ තීරණය ක්‍රියාත්මක කරන ආයතනයක් හඳුනාගැනීමේ හැකියාව සහ නිරීක්ෂණය කළ හැකි අවසන් ප්‍රතිඵලයක් අඩංගු වීම යන කරුණු මත පදනම්වය. ඊට අමතරව පාස්කු ඉරිදා ප්‍රහාරයේ බලපෑම හේතුවෙන් 2019 වසරේ ඇතැම් අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම අඩාල විය. 2019 අයවැය කතාවෙන් ඉදිරිපත් වූ එහෙත් එම වසරේ සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක නොවූ එවන් අයවැය යෝජනා 8ක ප්‍රගතියද 2020 දී ඇගයීමට ලක් කරන ලදී.

2020ට පෙර ඇගයීම් වලදී, පහත සඳහන් නිර්ණායක අනුව තෝරාගත් යෝජනා ඇගයීමට ලක් කරන ලදී.

| වසර | අයවැය කතාවෙහි සඳහන් ඇගයීමට ලක් කිරීමට තෝරාගත් වියදම් යෝජනා | | | තෝරාගත් ප්‍රතිපත්ති යෝජනා |
|---|---|---|---|---|
| | තෝරා ගැනීමේ සීමාව* | යෝජනා ගණන | යෝජනා වල මුළු වටිනාකම | |
| 2017 | රු. බිලියන 1ට වැඩි | 37 | රු. මිලියන 116,910 | 0 |
| 2018 | රු. බිලියන 1ට වැඩි | 38 | රු. මිලියන 149,350 | 0 |

| | | | | |
|---|---|---|---|---|
| 2019 | රු. මිලියන 500 ට වැඩි | 37 | රු. මිලියන 100,875 | 22 |

වසරකට දෙවතාවක් යාවත්කාලීන කරන මෙම ඩැෂ්බෝඩය නව වියදම් හා ප්‍රතිපත්ති යෝජනා ඇතුලත් අයවැය කතාවෙහි සඳහන් යෝජනාවල විවෘතභාවය සහ ප්‍රගතිය දර්ශක දෙකක් යටතේ ඇගයීමට ලක් කරයි. 2020 වසරේ කැබිනට් තීරණ මෙන්ම ඊට පෙර වසරවල අයවැය යෝජනා ඇගයීමට ලක් කරනු ලැබුවේ ප්‍රසිද්ධියේ මාර්ගගතව ලබා ගත හැකි තොරතුරු සහ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ කරන ලද ඉල්ලීම් හරහා ලබා ගත් තොරතුරු ඇසුරෙන්ය.

ආණ්ඩුවේ අර්ධ වාර්ෂික කාර්ය සාධනය එම වසරේ ඔක්තොබර් මස තුළදීද, සමස්ථ වාර්ෂික කාර්ය සාධනය ඊළඟ වසරේ අප්‍රේල්/ මැයි මස තුළදීද එළි දක්වයි. එහෙත් 2019 සහ 2020 යන වසර සඳහා තෝරාගත් යෝජනා වල ඇගයීම කරන ලද්දේ වසර අවසානයේදී පමණි. 2019 වසරේ අයවැය කතාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කලේ එම වසරේ මාර්තු මාසයේ වීම සහ 2020 වසරේ අයවැය කතාවක් නොමැති වීම මීට හේතු විය.

* 2017 සහ 2018 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජනා සඳහා යෝජිත වියදම් වෙන් කිරීම මත පමණි. අයවැය කථාවේ වාර්තාකරණ ආකෘතියේ වෙනසක් හේතුවෙන් 2019 දී තෝරා ගැනීමේ සීමාව පදනම් වූයේ යෝජිත ප්‍රතිපාදන යෝජනාව සහ එයට දැනටමත් වෙන් කර ඇති මුදල එකතු කිරීම මත ය.j

# 1. වියදම් යෝජනා

## 1.1. විවෘතභාවය ඇගයීම

මෙම දර්ශකය, තෝරාගත් යෝජනා/පොරොන්දු සම්බන්ධයෙන්, රජය පවසන්නේ ක්‍රියාවට නංවන දෙයද යන්න අධ්‍යයනය කෙරේ. මෙහි දී අගයීමට ලක් කරන්නේ පොරොන්දු වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු කොපමණ දුරට රජය හෙළිදරව් කරන්නේද යන්නයි. මේ සඳහා අවශ්‍ය අයවැය පොරොන්දුවලට අදාළ තොරතුරු අදාළ රාජ්‍යය ආයතනයේ වෙබ් අඩවි පරීක්ෂා කිරීම සහ තොරතුරු දැනගැනීමේ පණත (RTI) යටතේ රාජ්‍යය ආයතන වෙත තොරතුරු ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම මගින් රැස්කර ඇත. ඊට අමතරව 2017 සහ 2018 වර්ෂවලදී රජයේ ආයතන වෙත ගොස් අදාළ නිලධාරීන් හමු වී තොරතුරු රැස් කිරීමද සිදු විය. කෙසේ වෙතත්, මෙම තොරතුරු රැස් කිරීමේ ක්‍රමය මේ වනවිට අත්හිටුවා ඇත.

අර්ධ වාර්ෂික ඇගයීමේදී, වසරේ පළමු මාස හය තුල ප්‍රගතිය පිළබඳ තොරතුරු හෙළි කිරීමේ ප්‍රවනතාව ඇසුරෙන් විවෘතභාවය ඇගයීමට ලක් කරනු ලැබේ. සමස්ත වසර අවසාන වනවිට අදාළ යෝජනා වල ප්‍රගතිය පිළිබඳ තොරතුරු හෙළි කිරීමේ ප්‍රවනතාව ඇසුරෙන් විවෘතභාවය වසර අවසානයේ ඇගයීමට ලක් කරනු ලැබේ.

විවෘතභාවය පිළබඳව පහත දැක්වෙන වර්ගීකරණය වියදම් සහ ප්‍රතිපත්තිමය යෝජනා දෙකටම පොදු වේ. ඇගයීම කරන අවස්ථාවේ දී ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව පහත පරිදි වර්ගීකරණය කර ඇත.

| | | |
|---|---|---|
| | **ආවෘත** | **සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට අවශ්‍ය කිසිදු තොරතුරක් නැත** |
| | සීමිත | තිබෙන තොරතුරු සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත |
| | උදාසීන | තිබෙන තොරතුරු සමස්ථ වසර තුල ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත |
| | සාධනීය | කැබිනට් තීරණයේ/අයවැය පොරොන්දුවේ ප්‍රගතියට අදාළ තොරතුරු අදාළ කාලය තුළ ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිය |
| | විවෘත | පොරොන්දුවේ සමස්ථ ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රගාමීව හෙළිදරව් කර ඇත |

## 1.2. රජයේ ආයතනවල විවෘතභාවය ශ්‍රේණිගත කිරීම

ඒ ඒ යෝජනාවල විවෘතභාවයට අමතරව එම යෝජනා ක්‍රියාත්මක කිරීමට වගකීම දරන අදාළ රාජ්‍ය ආයතන එම යෝජනාවල ප්‍රගතිය පිළබඳ තොරතුරු හෙළිදරවු කිරීමේ ප්‍රවනතාව මත පදනම්ව එම ආයතනවල විවෘතභාවය පිළිබඳ සංසන්දනාත්මක ශ්‍රේණිගත කිරීමක්ද මෙම ඩැෂ්බෝඩය හරහා ප්‍රකාශයට පත් කර ඇත. සෑම ආයතනයකටම 0 සිට 4 දක්වා ලකුණු ලබා දී ඇති අතර ඉහළම ලකුණු මට්ටම පෙන්නුම් කරන්නේ ලකුණු 4 කින්ය. තොරතුරු භාවිතයට සුදුසු වීම/ භාවිතා කිරීමේ හැකියාව: ලබා ගත් තොරතුරු, සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගත හැකි, අර්ධ වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි සහ කිසිසේත්ම ප්‍රයෝජනයට ගත නොහැකි යනුවෙන් බාණ්ඩ තුනකට වර්ග කර, පිලිවෙලින් 4, 2 සහ 0 වශයෙන් ලකුණු ලබා දෙන ලදී.


2020ට පෙර ඇගයීම්වල දී රාජ්‍ය ආයතනය සඳහා වන සමස්ත ලකුණු ගණනය කරනු ලබන්නේ එම ආයතනයේ විෂය පථයට අයත් එක් එක් පොරොන්දුවේ ලකුණු වල බරිත සාමාන්‍යයක් ලෙස ය. සෑම කැබිනට තීරණයක්ම/පොරොන්දුවක්ම 0 සිට 100 දක්වා පරාසයක් තුල ඇගයීමට ලක් කෙරේ. සෑම කැබිනට තීරණයක්/පොරොන්දුවක් සඳහාම ලකුණු ගණනය කරන (i) පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමේදී ලද තොරතුරු කොපමණ දුරට ප්‍රයෝජනවත්ද සහ (ii) කොතරම් පහසුවෙන් එම තොරතුරු ලබා ගත හැකි වුවාද යන කරුණු දෙක මත ය.

2020 දී අයවැය කථාවක් නොමැතිකම හේතුවෙන් ප්‍රතිපාදන පිළිබඳ තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. එම හේතුවෙන් සරල සාමාන්‍ය ක්‍රමයක් භාවිතා කරමින් ආයතන ශ්‍රේණිගත කිරීම් ගණනය කරන ලදී.

ලකුණු ලබා දීමෙන් අනතුරුව, වර්ෂය තුළ ඔවුන්ගේ සාපේක්ෂ ක්‍රියාකාරිත්වය පෙන්නුම් කරමින්, වැඩිම ලකුණු ගත් ආයතනයේ සිට අඩුම ලකුණු ගත ආයතනය දක්වා රාජ්‍ය ආයතන ඉහළ සිට පහළට ශ්‍රේණිගත කර ඇත.

### තොරතුරු ලබා ගැනීමේ පහසුව:

ලබාගත් තොරතුරු වල ප්‍රයෝජනවත්බව අනුව ලබා දුන් ලකුණු, එම තොරතුරු ලබා ගැනීමේ පහසුව අනුව නැවත සකස් කරනු ලැබේ. මෙහිදී තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලුම් කිරීමෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාවට සාපේක්ෂව අන්තර්ජාලය හරහා ඉල්ලුම් කිරීමකින් තොරව තොරතුරු ලබා ගැනීමේ හැකියාවට වැඩි ලකුණු හිමි වෙයි.




## 1.3. ප්‍රගතිය මැනීම

මේ දර්ශකය යටතේ රජය තමන් සිදු කරන බව පැවසූ ක්‍රියාකාරකම් කෙතරම් දුරකට ඉටු කර ඇත්ද යන්න විමසා බැලේ. එනම් යෝජනා ඉටු කිරීමේ ප්‍රගතිය ඇගයීමට ලක්කරයි. මෙම ඇගයීම කරන්නේ යෝජනාව ඉටුකිරීමට වගකිව යුතු රාජ්‍ය ආයතනය විසින්ම ප්‍රකාශයට පත් කරන ලද කාලසීමාවන් හා ඉලක්ක පදනම් කරගෙනය.

ඇගයීමට ලක් කළ යෝජනාවලවල *අර්ධ වාර්ෂික ප්‍රගතිය* පහත පරිදි වර්ගීකරණය කර ඇත.

| | | |
|---|---|---|
| ? | **හෙළිකර නැත** | **ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත** |
| | අතහැර දමා ඇත- | මෙම කැබිනට් තීරණය/පොරොන්දුව තක්සේරු කිරීමේ වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොමැත |
| | නොසලකා හැර ඇත | කැබිනට් තීරණය/පොරොන්දුව ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇතත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර නැත |
| | මන්දගාමී ප්‍රගතියක් ඇත | මෙම කැබිනට් තීරණය/පොරොන්දුව ක්‍රියාවට නංවා ඇතිමුත් නියමිත කාලයට කටයුතු සිදු කිරීමට අසමත් වී ඇත |
| | සතුටුදායක ප්‍රගතියක් ඇත- | මෙම කැබිනට් තීරණය/පොරොන්දුව ක්‍රියාවට නංවා ඇති අතර අදාළ ඉලක්කය අත්පත් කරගෙන හෝ ඉලක්කය අභිබවා ගොස් ඇත* |

---

*යෝජනාවක් සතුටුදායක ප්‍රගතියක් ලබාඇති බවට වර්ගීකරණය කෙරෙනුයේ ජුනි 30වන දින වන විට අයවැය වර්ෂයේ ඉලක්ක වලින් 90% ක් වත් අදාළ කාලය තුළ නිම කර ඇත්නම් පමණි.

ඇගයීමට ලක් කළ යෝජනාවල *වාර්ෂික ප්‍රගතිය* පහත පරිදි වර්ගීකරණය කර ඇත.

| | |
|---|---|
| **හෙළිකර නැත** | **ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත/ ප්‍රයෝජනයට ගත නොහැක.** |
| අතහැර දමා ඇත | වසරේ ක්‍රියාකාරී සැලසුමෙන් ඉවත්කර හෝ වසර තුල කිසිදු ප්‍රගතියක් වාර්තා කර නොමැත |
| දුර්වලයි | ඉලක්කගත ප්‍රගතියෙන් 33% වඩා අඩු ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. |
| අර්ධ සම්පූර්ණයි | ඉලක්කගත ප්‍රගතියෙන් 33%-66% අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. |
| සැළකිය යුතුයි | ඉලක්කගත ප්‍රගතියෙන් 66%-80% ත් අතර ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. |
| සම්පූර්ණයි- | ඉලක්කගත ප්‍රගතියෙන් 80% ඉක්මවූ ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත |

## 2. ප්‍රතිපත්ති යෝජනා ඇතුලත් කැබිනට් තීරණ

2019 දී BudgetPromises විසින් අයවැය කථාවේදී රජය විසින් කරන ලද ප්‍රතිපත්තිමය කැපවීම්වල ප්‍රගතිය ඇගයීම සඳහා සිය විෂය පථය පුළුල් කළේය. ප්‍රතිපත්ති යෝජනා සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොවේ. .

ක්‍රියාත්මක කර ඇතිද යන බව නිර්ණය කිරීම සඳහා නීති සම්පාදනය කිරීමක් හෝ රෙගුලාසි ගැසට් එකක් හරහා ප්‍රකාශයට පත් කිරීමක් අවශ්‍ය වන යෝජනා මෙම ඇගයීම සඳහා තෝරා ගන්නා ලදී.

පොදුවේ ලබා ගත හැකි ගැසට් නිවේදන, රජයේ චක්‍රලේඛ, රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවේ කැබිනට් තීරණ පිළිබඳ නිවේදන වලින් සහ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ගොනු කරන ලද හරහා තොරතුරු ලබා ගත තොරතුරු ආශ්‍රයෙන් ඇගයීම කරන ලදී.

## 2.1. ප්‍රගතිය මැනීම

ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීමේදී රජය ලබා ඇති ප්‍රගතිය පහත පරිදි වර්ගීකරණය කර ඇත

| | | |
|---|---|---|
| ? | **හෙළිකර නැත** | **ප්‍රගතිය ඇගයීමට කිසිදු තොරතුරක් නැත. නැතහොත් පවත්නා තොරතුරු ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් නැත** |
| ✕ | ක්‍රියාත්මක කර නැත | යෝජනාවේ කිසිදු කොටසක් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) ප්‍රකාශයට පත් කර නොමැත. අදාළ අමාත්‍යාංශය / රජයේ ආයතනය විසින් මෙය ලිඛිතව සනාථ කර ඇත. |
| ◐ | අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත | යෝජනාවේ සියලුම කොටස් සඳහා නොව සමහර කොටස් සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන දැනුම්දීම් (ගැසට්) ප්‍රකාශයට පත් කර ඇත. |
| ✓ | සම්පූර්ණව ක්‍රියා ත්මක ක ර ඇත | ප්‍රතිපත්ති යෝජනාව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඇත. යෝජනාවේ සම්පූර්ණ විෂය පථය සඳහා අවශ්‍ය ව්‍යවස්ථාදායක/ නීතිකාරක/ නීති සම්පාදක පැනවීමක් හෝ නියාමන නිවේදනය (ගැසට් පත්‍රය) ප්‍රකාශයට පත් කර ඇති අතර වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ. |

## 3. ප්‍රගතිය, විවෘතභාවය සහ ශ්‍රේණිගත කිරීමේ තක්සේරු පිළිබඳ විස්තර.

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| බස් නැවතුම්පළ සහ දුම්රිය ස්ථානවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම | ආවෘත | හෙළිකර නැත | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය |
| | මෙම පොරොන්දුවට අදාළ කිසිදු තොරතුරක් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ හෝ වගකිවයුතු ආයතනයන්හි වෙබ් අඩවිවලින් හෝ ලබා ගත නොහැකි විය. තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත නාගරික සංවර්ධන හා නිවාස කැබිනට් අමාත්‍යාංශයෙන් නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට මාරු කරන ලදී. රාජ්‍ය අමාත්‍යාංශය නැවතත් තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත කැබිනට් අමාත්‍යාංශයට මාරු කරනු ලැබුවේ ඔවුන් එම යෝජනාව ක්‍රියාත්මක කරන අමාත්‍යාංශය නොවන බව පවසමිනි. යෝජනාව ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන අමාත්‍යාංශය පිළිබඳ තොරතුරු ලබා දීමට කැබිනට් අමාත්‍යාංශය අසමත් විය. මෙම යෝජනාව නාගරික සංවර්ධන අධිකාරියේ මෙගපොලිස් අමාත්‍යාංශය යටතේ ප්‍රථමයෙන් ක්‍රියාත්මක වූ නමුත්, රජයේ මාරුවත් සමග නාගරික සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අමාත්‍යාංශයට මාරු කරන ලදී. එබැවින්, නාගරික සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස හඳුනා ගන්නා ලදී. | ක්‍රියාත්මක කිරීමේ ආයතනය හඳුනාගත නොහැකි වූ බැවින් යෝජනාවේ ප්‍රගතිය ඇගයීම සඳහා තොරතුරු ලබා ගත නොහැකි විය. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 12 වන ස්ථානයට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 1.67 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 3 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | සීමිත | හෙළිකර නැත | නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා<br><br>පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |
| සුබිතපුරවර" නගර සංවර්ධන වැඩසටහන | තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත වෙත ලැබුණු තොරතුරුවලින් ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රගති වාර්තා අන්තර්ජාලය හරහා ලබා ගත හැකිබව ප්‍රකාශ උන නමුත් 2020 වසරේදී මෙම යෝජනාව සඳහා වගකිවයුතු ආයතනයන්හි වෙබ් අඩවිතුලින් හෝ අන්තර්ජාලය තුලින් හෝ කිසිදු තොරතුරක් ලබා ගත නොහැකි විය. තවද, රු, 428 ගෙවීමෙන් පසු නාගරික සංවර්ධකයින්, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයන් 2020 සඳහා ගිණුම් මත ඡන්දය ප්‍රකාශ කිරීමෙන් ක්‍රියාකාරී සැලසුම් ලබාගත හැකි විය. කෙසේ වෙතත්, මෙම යෝජනාව එහි සඳහන්ව නොතිබිණි. | වාර්ෂික ඉලක්ක සහ ප්‍රගතිය පැහැදිලි ලෙස දක්වා නැති නිසා අන්තර්ජාලයේ ඇති තොරතුරු ඇගයීම අතිශයින් දුෂ්කර විය. අන්තර්ජාලයේ තොරතුරු ලබා දී ඇති ආකාරය හේතුවෙන් ඇගයීම සඳහා ඇගයුම්කරුගේ පැත්තෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අනුමාන කිරීම අවශ්‍ය වේ. | නාගරික සංවර්ධන අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 13 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 1 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| "සහසර බස් නවීකරණ " වැඩසටහන | සීමිත | හෙළිකර නැත | ප්‍රවාහන අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
| --- | --- | --- | --- |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීම ප්‍රථමයෙන් යොමුකළ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයන් හෝ පසුව එය මාරු කරන ලද ප්‍රවාහන අමාත්‍යාංශයෙන් හෝ තොරතුරු ලබාගැනීමට නොහැකි විය. තක්සේරු කර ඇති සම්පූර්ණ වර්ෂය සඳහා තොරතුරු නොලැබුණු නමුත් කොටසකට තොරතුරු නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකි විය. | වාර්ෂික ඉලක්ක සහ ප්‍රගතිය පැහැදිලි ලෙස දක්වා නැති නිසා අන්තර්ජාලයේ ඇති තොරතුරු ඇගයීම අතිශයින් දුෂ්කර විය. අන්තර්ජාලයේ තොරතුරු ලබා දී ඇති ආකාරය හේතුවෙන් ඇගයීම සඳහා ඇගයුම්කරුගේ පැත්තෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අනුමාන කිරීම අවශ්‍ය වේ. | ප්‍රවාහන අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 13 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 1 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට නවීන පහසුකම් හා භාවිතය | ආවෘත | | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ප්‍රවාහන අමාත්‍යාංශය) |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| පහසු බස් රථ 250 ක් අත්කර ගැනීම | තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත, 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනතේ , II (d) වගන්තිය උපුටා දක්වමින් ප්‍රතික්ෂේප කරන ලදි. කෙසේ වෙතත්, 2019 චක්‍රයේ දී, එම යෝජනාව සඳහා ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ප්‍රගති වාර්තා සහ ක්‍රියාකාරී සැලසුම් ලබා දී ඇත. බස්රථ අත්කරගෙනීම පිළිබඳ කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුලින් ලබා ගත නොහැකි විය. | 2020 වර්ෂයේදී මෙම යෝජනාවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | ප්‍රවාහන අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 13 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 1 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| "රන් මාවත්" ග්‍රාමීය පාරවල් නඩත්තු හා ඉදිකිරීමම් වැඩසටහන | සාධනීය | සැළකිය යුතුයි | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් තොරතුරු ලබා ගත හැකි විය. තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත කැබිනට් අමාත්‍යාංශයෙන් රාජ්‍ය අමාත්‍යාංශයට මාරු කරන ලදී. තවද, කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුලින් ලබා ගත නොහැකි විය. | තොරතුරු දැනගැනීමේ අයිතිය යටතේ ඉදිරිපත් කල ඉල්ලුම්පතට ලැබුණු තොරතුරුවලට අනුව වර්ෂය සඳහා භෞතික ඉලක්ක කිසිවක් නියම කර නොමැති නමුත් බිල්පත් ගෙවීම සඳහා වියදම් දරා ඇත. තොරතුරු නොලැබුණු හෙයින්, 2019 දී මෙම යෝජනාව අනාවරණය නොකළ යැයි වර්ගීකරණය කරන ලදී . කෙසේ වෙතත්, 2020 දී ලැබුණු තොරතුරුවලින් පෙන්වන්නේ බිල්පත් පියවීම සඳහා අරමුදල් උපයෝගී කර ගත් නිසා භෞතික ප්‍රගතියක් ඇති වූ බවයි. එබැවින් අයවැය ප්‍රතිපාදන සහ සැබෑ වියදම් මත පදනම්ව, සැලකිය යුතු ප්‍රගතියක් සිදුවී ඇතැයි සැලකේ. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 18 වන ස්ථානයට ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 0.50 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 2 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| "ග්‍රාමශක්ති" නිෂ්පාදන ගම්මාන වැඩසටහන | සාධනීය | සැළකිය යුතුයි | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය (ජාතික අයවැය දෙපාර්තමේන්තුන් සහ මුදල් අමාත්‍යාංශයෙන් තොරතුරු ලබා ගන්නා ලදී) |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ  පනත යටතේ ගොනු කර ඇති ඉල්ලීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලබා ගත හැකි විය. සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මෙම යෝජනාවේ වර්තමාන ක්‍රියාත්මක කිරීමේ ආයතනය බව, මුදල් අමාත්‍යාංශයෙන් පසුව දැනුම් දී ඇත. මෙම යෝජනාව පිළිබඳ කිසිදු තොරතුරක් 2020 සඳහා අන්තර්ජාලය තුලින්ලබා ගත නොහැකි විය | ව්‍යාපෘතියේ භෞතික ඉලක්ක සහ භෞතික ප්‍රගතිය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම විසින් සපයා නොමැති අතර මූල්‍ය ප්‍රගතිය ප්‍රොක්සියක් ලෙස භාවිතා කරනු ලැබුවේ වියදම් කළ සැබෑ මුදල වර්ෂය සඳහා වෙන් කළ ප්‍රමාණය සමඟ සැසඳීමටය. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම යටතේ යොමු කළ ඉල්ලුම්පතට දැක්වූ ප්‍රතිචාරයේ දී ජාතික අයවැය දෙපාර්තමේන්තුව ප්‍රකාශ කළේ වෙන් කරන ලද මුදල හා සැබෑ වියදම් පදනම් වී ඇත්තේ දෙපාර්තමේන්තුවේ ඇති තොරතුරු මත වන අතර වර්තමානයේ ක්‍රියාත්මක කරන ආයතනය වන සමුර්දි, ගෘහ ආර්ථිකය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියාව, ව්‍යාපාර සංවර්ධනය සහ අඩු උපයෝජිත රාජ්‍ය සම්පත් සංවර්ධනය සඳහා රාජ්‍ය අමාත්‍යාංශයට තොරතුරු දැන ගැනීමේ අයිතිය ගොනු කිරීමෙන් තවත් තොරතුරු ලබා ගත  හැකි විය.  වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය විවිධ වියදම් ආයතන හරහා කිහිප වතාවක් මාරු වූ බව ද දෙපාර්තමේන්තුව පවසයි. | සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌන උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 5 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන හයෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 3 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| ආපදා කළමනාකරණ අවිනිශ්චිත අරමුදල” සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම | සීමිත | හෙළිකර නැත | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |
| | ආරක්ෂක අමාත්‍යාංශයට මුලින් යොමු කළ තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත, එම අමාත්‍යාංශය විසින් ජාතික ආරක්ෂක හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට මාරු කර යවන ලද බව පැවසුවද, රාජ්‍ය අමාත්‍යාංශය කියා සිටියේ තමන්ට මෙම ලිපිය ලැබී නොමැති බවය. එබැවින් තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත නැවතත් සෘජුව ආපදා කළමනාකරණ | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට ප්‍රගති සාරාංශ වාර්තාව, අවම කිරීමේ පර්යේෂණ හා සංවර්ධනය සඳහා 2020 සඳහා  ක්‍රියාකාරී සැලැස්ම   සූදානම් වීමේ සැලසුම් අංශය සඳහා 2020 සඳහා ක්‍රියාකාරී සැලැස්ම, පුහුණුව හා දැනුවත්භාවය සඳහා 2020 සඳහා සංශෝධිත | ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 13 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන පහෙන් එකකි. සමාගමට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 1 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
| --- | --- | --- | --- |
| | මධ්‍යස්ථානය වෙත යොමු කරන ලදී. මෙම යෝජනාව පිළිබඳ කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුළින් හෝ ලබා ගත නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්ම සහ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සඳහා 2020 සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ආදී තොරතුරු තොරතුරු දැනගැනීමේ අයිතවාසිකම යටතේ යොමු කළ ඉල්ලුම්පතට ලැබුණු තොරතුරුවලට ඇතුලත් විය. කෙසේ වෙතත්, මෙම කිසිදු සැකැස්මක් මගින් ආපදා කළමනාකරණ අවිනිශ්චිත අරමුදල පිළිබඳ කිසිදු තොරතුරක් අඩංගු නොවූ හෙයින් ප්‍රගතිය ඇගයීම් කළ නොහැකි විය. | කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ සමාගමේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| | සීමිත | හෙළිකර නැත | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| ජාතික ස්වභාවික ආපදා රක්ෂණ ක්‍රමය | ආරක්ෂක අමාත්‍යාංශයට මුලින් යොමු කළ තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත, එම අමාත්‍යාංශය විසින් ජාතික ආරක්ෂක හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට මාරු කර යවන ලද බව පැවසුවද, රාජ්‍ය අමාත්‍යාංශය කියා සිටියේ තමන්ට මෙම ලිපිය ලැබී නොමැති බවය. එබැවින් තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත නැවතත් ඍජුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කරන ලදී. මෙම යෝජනාව පිළිබඳ කිසිදු තොරතුරක් අන්තර්ජාලය තුලින් හෝ ලබා ගත නොහැකි විය. | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 2020 දෙසැම්බර් 31 දින වන විට ප්‍රගති සාරාංශ වාර්තාව, අවම කිරීමේ පර්යේෂණ හා සංවර්ධනය සඳහා 2020 සඳහා ක්‍රියාකාරී සැලැස්ම සූදානම් වීමේ සැලසුම් අංශය සඳහා 2020 සඳහා ක්‍රියාකාරී සැලැස්ම, පුහුණුව හා දැනුවත්භාවය සඳහා 2020 සඳහා සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම සහ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සඳහා 2020 සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම ආදී තොරතුරු තොරතුරු දැනගැනීමේ අයිතවාසිකම යටතේ යොමු කළ ඉල්ලුම්පතට ලැබුණු තොරතුරුවලට ඇතුලත් විය. කෙසේ වෙතත්, මෙම කිසිදු සැකැස්මක් මගින් ආපදා කළමනාකරණ අවිනිශ්චිත අරමුදල පිළිබඳ කිසිදු තොරතුරක් අඩංගු නොවූ හෙයින් ප්‍රගතිය ඇගයීම් කළ නොහැකි විය | ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 13 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන පහෙන් එකකි. සමාගමට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 1 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ සමාගමේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල උපාධි පාඨමාලා හැදෑරීමට සිසුන් වෙත ලබා දෙන පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය සඳහා ඇතුළත් වීමට ඇති අවස්ථා පුළුල් කිරීම | සාධනීය | අර්ධ සම්පූර්ණයි | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කර ඇති තොරතුරු සඳහා කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රගති වාර්තා ලැබුණි. මෙම යෝජනාව පිළිබඳ කිසිදු තොරතුරක් වගකිවයුතු ආයතනයන්හි වෙබ් අඩවිතුලින් හෝ අන්තර්ජාලය තුලින් හෝ ලබා ගත නොහැකි විය. | 2020 සඳහා ක්‍රියාකාරී සැලැස්ම සිසුන් 5000 ක් ඉලක්ක කර ගත් අතර ප්‍රගති වාර්තාවේ සඳහන් වන්නේ 2020 4 වන කාර්තුව අවසන් වන විට සිසුන් 2242 ක් බඳවාගෙන ඇති බවයි. ප්‍රගති වාර්තාවේ 'බඳවා ගත් සිසුන් සංඛ්‍යාව' (සිසුන් 2242) සහ 2020 සඳහා 'ලියාපදිංචි' වූ සිසුන් සංඛ්‍යාව (සිසුන් 2569) අතර සුළු වෙනසක් ඇත. | අධ්‍යාපන අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 5 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන හයෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 3 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | ගණනය කිරීමේ අරමුණ සඳහා, ප්‍රගති වාර්තාවේ දක්වා ඇති ගණන ගෙන ඇත | පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 2 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| 2019 මුදල් වර්ෂයේ ගෙවීම් නිරවුල් කර නොමැති බිල්පත් පියවීම වෙනුවෙන් ප්‍රතිපාදන සලසා ගැනීම | විවෘත | අර්ධ සම්පූර්ණයි | ජාතික අයවැය දෙපාර්තමේන්තුව (මුදල් අමාත්‍යාංශය) |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීම මගින් තොරතුරු ලබා ගැනීමට හැකිවිය. ක්‍රියාත්මක කිරීමේ ආයතනය තමන් නොවන බව කියා සිටිමින් තොරතුරු දැන ගැනීමේ ඉල්ලුම්පත ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අතර කිහිප වතාවක් හුවමාරු කෙරෙන ලදී. අවසාන වශයෙන්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් මෙයට ප්‍රතිචාර ලැබුණි. කැබිනට් තීන්දුවේ දක්වා ඇති වටිනාකමට සමාන නොගෙවන ලද බිල්පත් වල වටිනාකම පිළිබඳ තොරතුරු 2019 මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවෙන් ලබා ගත හැකිය. මෙම යෝජනාවේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු මුදල් අමාත්‍යාංශයේ 2019 වාර්ෂික වාර්තාව 2019 සහ 2021 අයවැය කථාව මගින් මාර්ගගතව ලබා ගත හැකිය. | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම යටතේ යොමු කල ඉල්ලුම්පතට ප්‍රතිචාර වශයෙන් ලැබුණු තොරතුරු තොරතුරු දැනගැනීමේ අය්තිවසිකම යටතේ යොමු කළ ඉල්ලුම්පතට ප්‍රතිචාර වශයෙන් ලැබුණු තොරතුරු වලට අනුව, 2019 නොගෙවන ලද බිල්පත් ගෙවීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක විසින් කටුම්පත් කළ යෝජනාවක් නීතිපති විසින් අනුමත කරන ලදී. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ ද, යෝජනාව ඉල්ලා අස්කර ගත් අතර එය ඡන්ද විමසීමේ අදියර දක්වා ඉදිරියට ද ගියේ නැත. . එබැවින් එම කැබිනට් තීරණය ක්‍රියාත්මක කිරීමට භාණ්ඩාගාරය කටයුතු කළේ නැත. කෙසේ වෙතත්, අන්තර්ජාලය හරහා ලබා ගත හැකි තොරතුරු අනුව රුපියල් බිලියන 242.7 ක ගෙවීම් කර ඇති හෙයින් ප්‍රගතිය අර්ධ සම්පූර්ණ වශයෙන් වර්ගීකරණය කර ඇත. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 3 වන ස්ථානයට මුදල් අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 3.40 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 5 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| | සීමිත | අර්ධ සම්පූර්ණයි | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ සංවර්ධන ව්‍යාපෘතිය II වන අදියර 2 වන පියවර 'අ' පැකේජය | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කර ඇති තොරතුරු ඉල්ලීම යටතේ කිසිදු තොරතුරක් ලැබී නොමැත. ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ වෙබ් අඩවියේ මාස 3 ක වැඩ සැලැස්මක් සහ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම පිළිබඳව සඳහනක් ඇත. ලබා ගත නොහැක. බාහිර සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙම ව්‍යාපෘතියේ කෙටි විස්තරයක්, TEC වටිනාකම සහ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති යටතේ ණය වටිනාකම පිළිබඳව සඳහනක් ඇත. | නිවාස 11, 317 ඉදිකිරීම මේ වන විටත් ආරම්භ කර ඇති අතර නිවාස 5000 ක් මහජනතාවට තෑගි කර ඇති බව පාර්ලිමේන්තුවේදී මතු වූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා ප්‍රකාශ කළේය. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 1 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන දෙකෙන් එකකි. අධිකාරියට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 4 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අධිකාරියේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| ගෘහස්ථ පානීය ජල සම්බන්ධතා 150,000ක් ලබා දීම | සාධනීය | දුර්වලයි | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රගති වාර්තා ලබා දී ඇත. මූලික ප්‍රතිපාදන වැනි යෝජනාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු අන්තර්ජාලයෙන් ලබා ගත හැකි නමුත් ප්‍රගතිය තක්සේරු කිරීමට ඒවා ප්‍රමාණවත් නොවේ. | ප්‍රගති වාර්තාවේ සඳහන් වන්නේ ඉලක්කගත සම්බන්ධතා 150,000 න් පළමු කාර්තු දෙක තුළ සම්බන්ධතා 42770 ක් ලබා දී ඇති බවයි. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම යටතේ ගොනුකළ ඉල්ලුම්පත හරහා ලැබුණු තොරතුරු වලින් දැක්වෙන්නේ ව්‍යාපෘතියේ ප්‍රගතියට කොවිඩ්-19 අහිතකර ලෙස බලපා ඇති බවයි. | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 5 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන හයෙන් එකකි. මණ්ඩලයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 3 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ මණ්ඩලයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල ප්‍රවේශ හිමිකම් ලබන සිසු දරුවන් හට ලබා දෙන 'මහපොළ ශිෂ්‍යත්ව' මුදල වැඩි කරදීම හා එම ශිෂ්‍යත්ව අවස්ථා ගණන පුළුල් කිරීම | ආවෘත | හෙළිකර නැත | වෙළඳ අමාත්‍යාංශය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කර ඇති තොරතුරු ඉල්ලීම යටතේ කිසිදු තොරතුරක් ලැබී නොමැත. තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පත වෙළඳ අමාත්‍යාංශයට මාරු කර ඇති අතර අමාත්‍යාංශයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. මහපෝලා ශිෂ්‍යත්ව සඳහා වන වියදම් පිළිබඳව අන්තර්ජාලය හරහා සාමාන්‍ය තොරතුරු ලබා ගත හැකි උවද එය මෙම කැබිනට් තීරණයට සෘජුව සම්බන්ධ නොවේ. | වර්ෂයේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 11 වන ස්ථානයට වෙළඳ අමාත්‍යාංශය පත්විය. අමාත්‍යංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 2 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 2 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| ස්ටේඩියම්ගම නිවාස ඒකක 1,000ක් සැලසුම් කිරීම හා ඉදිකිරීම | සීමිත | හෙළිකර නැත | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය<br><br>කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කර ඇති තොරතුරු ඉල්ලීම යටතේ කිසිදු තොරතුරක් ලැබී නොමැත. " 2020 ජුනි 30 දින වන විට සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය" නැමෙති අන්තර්ජාල ලේඛන තුලින් ව්‍යාපෘතිය පිළිබඳ අර්ධ වශයෙන් තොරතුරු සොයාගත හැකිය. ව්‍යාපෘතිය සඳහා විශේෂිත වූ ක්‍රියාකාරී සැලසුම් හෝ ප්‍රගති වාර්තා වගකිවයුතු ආයතනයන්හි වෙබ් අඩවිවලින් හෝ අන්තර්ජාලයෙන් ලබා ගත නොහැකි විය. | "2020 ජුනි 30 දින වන විට සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් වල භෞතික හා මූල්‍යමය ප්‍රගතිය " නම් වූ ලේඛනයේ මෙම ව්‍යාපෘතිය අමාත්‍යාංශයේ "කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘතියට සහාය" යටතේ ඇති ව්‍යාපෘති හයෙන් එකකි. එබැවින් මූල්‍ය හා භෞතික ඉලක්ක සහ ප්‍රගතිය ඇගයීමේදී ව්‍යපෘති 6හි ප්‍රගතිය වෙන වෙනම දක්වනවා වෙනුවට "කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘතියට සහාය වීම" සමස්ථයක් ලෙස සළකා ප්‍රගතිය | ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 5 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන හයෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 3 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | ඇගයීමට ලක් කර ඇත. 2020 ජුනි 30 වන දින වන විට ඔබේසේකරපුර සඳහා "සැලසුම් සහ අඩවි බලමුලු ගැන්වීමේ කටයුතු" අඛණ්ඩව සිදුවන බව ලේඛනයේ සඳහන් වන නමුත් ප්‍රගතිය මැනීමට පවතින තොරතුරු ප්‍රමාණවත් නොමැත. | ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| ඉන්දීය ණය පහසුකම් යටතේ සූර්ය බල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | සීමිත | හෙළිකර නැත | විදුලිබල අමාත්‍යාංශය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කර ඇති තොරතුරු ඉල්ලීම යටතේ කිසිදු තොරතුරක් ලැබී නොමැත. ක්‍රියාකාරී සැලසුම් හෝ ප්‍රගති වාර්තා අන්තර්ජාලය හරහා ලබා ගත නොහැකි නමුත් ණය මුදලේ කොටසකින් ඉදිකරන මහා පරිමාණ පීවී විදුලි බලාගාරයක පූර්ව ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශකවරුන් සෙවීමට ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය ටෙන්ඩරයක් නිකුත් කර තිබේ. | ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. අවම වශයෙන් මෙම ව්‍යාපෘතියේ කොටසක් ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතින බව අන්තර්ජාලයෙන් සොයාගන්නා ලද අභිලාෂය ප්‍රකාශය කිරීම සඳහා ආරාධනා කරන ලේඛනයෙන් හැඟවේ. | විදුලිබල අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 13 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 1 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකාය' පිහිටුවීම | සාධනීය | අර්ධ සම්පූර්ණයි | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය (ජනාධිපති ලේකම් කාර්යාලය) |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කරන ලද ඉල්ලීම මගින් තොරතුරු ලබා ගැනීමට හැකිවිය. තවද, දෙපාර්තමේන්තුව සඳහා ඇස්තමේන්තුගත හා තාවකාලික වාර්ෂික ප්‍රතිපාදන පිළිවෙලින් 2020 සහ 2021 අනුමත | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම වෙත ලැබුණු තොරතුරුවලට අනුව, 2011.12.19 දින බහු ක්‍රියාකාරකම් සංවර්ධන කාර්ය සාධක බලකාය පිහිටුවන ලදී. මෙම දෙපාර්තමේන්තුව මීට පෙර ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පැවති | |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | අයවැය ඇස්තමේන්තු මගින් අන්තර්ජාලය හරහා ලබා ගත හැකිය. | නමුත් 2020 සැප්තැම්බර් මාසයේ සිට තමන්ගේම වියදම් ඒජන්සියක් ලෙස ක්‍රියාත්මක වීමට පටන් ගෙන තිබේ. පළමු අදියරේදී 34,553 දෙනෙකු පුහුණු වැඩසටහන සඳහා බඳවා ගන්නා ලදී. කොවිඩ්-19 හේතුවෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් සීමිත විය යුතු බවත් සමහර විට එය නතර කළ යුතු බවත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සඳහන් කරන ලදී. | |
| ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල ගැටුම්වලින් පීඩාවට පත් වූවන්ට නව තාක්ෂණික කොන්ක්‍රීට් පැනල්වලින් සමන්විත ස්ථිර නිවාස ඉදි කිරීම | ආවෘත | හෙළිකර නැත | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය<br><br>කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කර ඇති තොරතුරු ඉල්ලීම යටතේ කිසිදු තොරතුරක් ලැබී නොමැත. තවද, මෙම පොරොන්දුව පිළිබඳ කිසිදු තොරතුරක් වගකිවයුතු ආයතනයන්හි වෙබ් අඩවිතුලින් හෝ අන්තර්ජාලය තුලින් හෝ ලබා ගත නොහැකි විය. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 18 වන ස්ථානයට ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 0.50 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 2 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති මූල්‍යයනය කිරීම | ආවෘත | හෙළිකර නැත | මහාමාර්ග අමාත්‍යාංශය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කර ඇති තොරතුරු ඉල්ලීම යටතේ කිසිදු තොරතුරක් ලැබී නොමැත. තවද, මෙම පොරොන්දුව පිළිබඳ කිසිදු තොරතුරක් වගකිවයුතු ආයතනයන්හි වෙබ් අඩවිවලින් හෝ අන්තර්ජාලයෙන් ලබා ගත නොහැකි විය. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | මහාමාර්ග අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 19 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන හයෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 0 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| | සීමිත | හෙළිකර නැත | මුදල් අමාත්‍යාංශය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| තුරු හා උතුරු මැද පළාත්වල වෙසෙන ණයගැතිභාවයෙන් පෙළෙන ජනතාව සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මුදල් අමාත්‍යාංශයට ගොනු කර ඇති ඉල්ලීම හරහා, යෝජනාවේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් පමණක් ලබා ගත හැකි විය. සපයන ලද තොරතුරු අසම්පූර්ණ වන අතර ඒවා තේරුම් ගනීමටද අපහසු විය. ව්‍යාපෘතිය පිළිබඳ සාමාන්‍ය තොරතුරු අන්තර්ජාලයෙන් ලබා ගත හැකිය. | තොරතුරු ලැබුනේ අනුරාධපුර දිස්ත්‍රික් මහලේකම් කාර්යාලයෙන් පමණක් වන අතර එහි ප්‍රගතිය 2012.01.31 දින දක්වා ලබා දී ඇත. එක් එක් වසර සඳහා ප්‍රගතිය වෙන වෙනම දක්වා නොමැති බැවින්, 2018 සිට ක්‍රියාත්මක වන මෙම වැඩ සටහන, 2020 දී ප්‍රගතියක් ලබා තිබේද යන්න නිශ්වය කළ නොහැක. ප්‍රගති වාර්තාවේ දැක්වෙන්නේ 2018.10.22 දින ලේකම් කාර්යාලයට රුපියල් මිලියන 250ක් ලැබී ඇති අතර රුපියල් මිලියන 23.599ක් 2012.01.31 දින දක්වා වියදම් කර ඇති බවයි. එබැවින් වර්ෂය සඳහා ප්‍රගතිය ඇගයීමට ප්‍රමාණවත් සාක්ෂි නොමැත. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 3 වන ස්ථානයට මුදල් අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 3.40 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 5 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| COVID - 19 වසංගතය වැළැක්වීමේ කටයුතු වෙනුවෙන් අවශ්‍ය වෛද්‍ය උපකරණ සපයා ගැනීම සඳහා ජපන් යෙන් මිලියන 800 ක ව්‍යාපෘති නොවන ජපාන ප්‍රදාන ආධාර | ආවෘත | හෙළිකර නැත | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කරන ඉල්ලීම මුලින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත යවන ලදී. ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මුදල් අමාත්‍යාංශය බව පවසමින් එය මුදල් අමාත්‍යාංශයට මාරු කරන ලදී. කෙසේ වෙතත්, මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ප්‍රතිචාර දක්වමින් කියා සිටියේ ඔවුන්ට කොන්ත්‍රාත්කරුගේ නම පමණක් ඇති නමුත් සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක කරන අමාත්‍යාංශය සෞඛ්‍ය අමාත්‍යාංශය බවත් එමඟින් සියලු ක්‍රියාකාරී සැලසුම් සහ ප්‍රගති වාර්තා ඔවුන් සමඟ තිබිය යුතු බවත්ය. එබැවින් තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට ප්‍රතිචාරයක් ලෙස කිසිදු තොරතුරක් | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | සෞඛ්‍ය අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 19 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන හයෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 0 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | නොලැබුණු අතර, ආරම්භක මාධ්‍ය නිවේදනය අමතරව යෝජනාව පිළිබඳ තොරතුරු අන්තර්ජාලය හරහා ලබා ගත නොහැක. | | |
| COVID - 19 වසංගතයෙන් පසු සංචාරක කර්මාන්තය සඳහා සහන ලබා දීම | සාධනීය | සම්පූර්ණයි | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ගොනු කර ඇති ඉල්ලීමට අර්ධ වශයෙන් තොරතුරු ලැබී ඇත. තොරතුරු දැනගැනීමේ ඉල්ලුම්පතට අනුව කැබිනට් තීන්දුවේ සඳහන් සහන ක්‍රියාමාර්ග 6 න් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වගකිව යුත්තේ, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි වී ඇති එක් සංචාරක මාර්ගෝපදේශකයෙකුට රු .20,000 / - ක් සහ සංචාරක රියදුරෙකුට රු .15,000 / - වන එකවර ගෙවීමට පමණක් බව සඳහන්ව ඇත (3වන සහ 4වන යෝජනාවන් ). අන්තර්ජාලයේ තිබෙන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ කාර්යසාධන වාර්තාවන් (ශ්‍රී ලංකා සංචාරක ශ්‍රී ලංකා සංචාරක වර්ෂය සමාලෝචනය: 2020) සහන ක්‍රියාමාර්ග පිළිබඳ අර්ධ තොරතුරු සපයයි. | තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම යටතේ යොමු කළ ඉල්ලුම්පතට ලැබුණු ප්‍රතිචාරයේ පැහැදිලිවම සඳහන් වන පරිදි, ශ්‍රී ලංකාවේ සංචාරක සංවර්ධන අධිකාරිය වගකිව යුත්තේ එක් සංචාරක මාර්ගෝපදේශකයෙකුට රු .20,000 / - ක් සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධනය යටතේ ලියාපදිංචි වී ඇති සංචාරක රියදුරෙකුට රු .15,000 / - බැගින් ගෙවීමට පමණි (3වන සහ 4වන යෝජනාවන්),. එබැවින් ප්‍රගතිය ඇගයීම් කරනු ලැබුවේ මෙම සහන ක්‍රියාමාර්ග දෙක සඳහා පමණි. භෞතික ඉලක්ක පිළිබඳ තොරතුරු අන්තර්ජාලය හරහා හෝ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම හරහා ලබා ගත නොහැකි වූ අතර මූල්‍ය ප්‍රගතිය ප්‍රොක්සියක් ලෙස භාවිතා කරන ලදී. මේ මත පදනම්ව, එක් සංචාරක මාර්ගෝපදේශකයෙකුට රු .20,000 / - බැගින් එකවර ගෙවීම සඳහා රුපියල් මිලියන 35ක් වෙන් කරන ලද අතර රුපියල් මිලියන 40.32ක් ඇත්ත වශයෙන්ම වියදම් කරන ලදී. ඔවුන්ගේ විෂය පථය යටතේ ඇති අනෙකුත් සහන පියවර සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දී නොමැති අතර එමගින් එහි ප්‍රගතිය ඇගයීම් කළ නොහැකිය. | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 19 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන හයෙන් එකකි. මණ්ඩලයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 0 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ මණ්ඩලයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත | විවෘත | සම්පූර්ණව ක්‍රියාත්මක ක ර ඇත | මුදල් අමාත්‍යාංශය |
| | මෙම තීන්දුවට අදාළ තොරතුරු 2020 අංක 2 දරණ මුදල් සංශෝධන පනත් කෙටුම්පත මඟින් ලබා ගත් අතර එය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ අදාළ ආයතනය වෙත ඉදිරිපත් කළ තොරතුරු ඉල්ලුම්පතට ලැබුණු ප්‍රතිචාරයද මාර්ගගත තොරතුරු මූලාශ්‍රය වෙත අපව යොමු කළේය. | 2020 ඔක්තෝබර් 12 දින, මුදල් අංක 2020 දරණ අංක 2 දරණ මුදල් සංශෝධන පනත 2018 අංක 35 දරණ පනතේ 36 වන වගන්තිය සංශෝධනය කර 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ණය ආපසු ගෙවීමේ බද්ද අවසන් කළේය. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 3 වන ස්ථානයට මුදල් අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 3.40 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 5 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| 2020 ජූනි මස 12 වන දිනට යෙදෙන ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට සමගාමීව සේවකයින් සේවයේ යෙදවිය හැකි අවම වයස අවුරුදු 16 වන පරිදි අදාළ කම්කරු නීති සංශෝධනය කිරීම | විවෘත | අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත | කම්කරු අමාත්‍යාංශය |
| | මෙම තීන්දුවට අදාළ තොරතුරු කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකි විය. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත යටතේ ගොනු කළ තොරතුරු ඉල්ලුම්පතට ලැබුණු ප්‍රතිචාරයද අන්තර්ජාලයෙන් ලබා ගත් තොරතුරු මූලාශ්‍රය වෙත අපව යොමු කළේය. | කම්කරු දෙපාර්තමේන්තුව මඟින් ලබා දුන් තොරතුරු මත පදනම්ව, පහත සඳහන් සංශෝධන සිදු කර ඇත.<br>1. සාප්පු හා කාර්යාල සේවකයින් (රැකියා හා වැටුප් නියාමනය) (සංශෝධන) පනත, 2021 අංක 1 - 2021 ජනවාරි 18 දින සහතික කරන ලදි<br>2. 2021 අංක 2 දරණ කාන්තා, තරුණ හා ළමා රැකියා පනත - 2021 ජනවාරි 18 දින සහතික කරන ලදි | කම්කරු අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 1 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන දෙකෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 4 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | 3. 2021 අංක 3 දරණ අවම වැටුප් (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත - 2021 ජනවාරි 18 දින සහතික කරන ලදි<br><br>4. 2021 අංක 4 දරණ කර්මාන්ත ශාලා (සංශෝධන) පනත - 2021 ජනවාරි 18 දින සහතික කරන ලදි.<br><br>1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ සංශෝධනවලට අදාළව කිසිදු තොරතුරක් නොලැබුණි. | |
| කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් සඳහා ලබා දෙන ණය පහසුකම්හි උපරිම ණය සීමාව වැඩි කිරීම සහ කෘෂි අගයදාම සංවර්ධන ව්‍යාපෘති ප්‍රවර්ධකයන් වෙත ගැලපුම් ණය හා ගැලපුම් ප්‍රදාන ලබා දීම | සීමිත | අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත | කෘෂිකර්ම අමාත්‍යාංශය |
| | කුඩා හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්වයේ (එස්ඒපී) වැඩ සටහන් අධ්‍යක්ෂවරයා විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත යොමු කරන ලද ලිපියක් ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, මෙම යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව තොරතුරු ලබාගෙන නොමැත. එම නිසා ප්‍රමාණවත් තොරතුරු නොමැති නිසා ලැබුනු තොරතුරු මත සම්පූර්ණ ප්‍රගතිය නිශ්චය කර ගැනීමට නොහැකි විය. | SAPP යටතේ ඇති ණය පහසුකම්වල ඉහළ සීමාව රුපියල් 300,000 සිට රුපියල් 500,000 දක්වා වැඩි කරන ලදි. කෙසේ වෙතත්, කෘෂි වටිනාකම් දාම නිෂ්පාදකයින් සඳහා ගැලපෙන ණය හා ගැලපෙන ප්‍රදාන පහසුකම් සම්බන්ධව කිසිදු තොරතුරක් නොමැත. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 10 වන ස්ථානයට කෘෂිකර්ම අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 2.50 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | | කරන ලද කැබිනට් තීරණ 2 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| මැඩ්රිඩ් ගිවිසුම යටතේ වෙළඳ හා සේවා ලකුණු ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම ක්‍රියාත්මක කිරීමට හැකි වනු පිණිස මැඩ්රිඩ් සන්ධාන පත්‍රයට ප්‍රවේශ වීම හා එයට අනුකූල වන පරිදි 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතට සංශෝධන සිදු කිරීම | විවෘත | ක්‍රියාත්මක කර නැත | වෙළඳ අමාත්‍යාංශය |
| | මෙම තීන්දුවට අදාළ තොරතුරු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කරන ලද 2021 අංක 8 දරණ බුද්ධිමය දේපල (සංශෝධන) පනත මඟින් ලබා ගන්නා ලදී. | තොරතුරු ලෙස ලබා ගත හැකි වූ 2021 අංක 8 දරණ බුද්ධිමය දේපල (සංශෝධන) පනතට අනුව 2021 ජනවාරි 18 දිනට කිසිදු සංශෝධනයක් සිදු කර නොමැත. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 11 වන ස්ථානයට වෙළඳ අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 2 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 2 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| දේශීය අදායම් සංශෝධන පනත් කෙටුම්පත | විවෘත | සම්පූර්ණව ක්‍රියාත්මක ක ර ඇත | මුදල් අමාත්‍යාංශය |
| | මෙම තීන්දුවට අදාළ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ඇති PN/IT/2020-03 (සංශෝධිත) දැන්වීම මඟින් ලබා ගන්නා ලදී. 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ගොනු කළ තොරතුරු ඉල්ලීම ද අපව වෙබ් අඩවියෙහි ඇති තොරතුරු මූලාශ්‍රය වෙත යොමු කළේය. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් PN/IT/2020-03 (සංශෝධිත) නිවේදනය 2020 පෙබරවාරි 18 දින නිකුත් කරන ලදි, එමඟින් ගෙවිය යුතු ගෙවීමේ (ගෙවීම්) බදු අනුපාත සංශෝධනය කරමින් රඳවා ගැනීමේ බද්දෙන් පොලී ආදායම නිදහස් කිරීම ක්‍රියාත්මක කරන ලදී. පර්යන්ත ප්‍රතිලාභ සඳහා අදාළ වන ආදායම් බදු අනුපාත සහ 2020 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආදායම් බදු සහ ආදායම් බදු අනුපාත වෙනස් කිරීම්. 2021 මැයි 13 දින | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 3 වන ස්ථානයට මුදල් අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 3.40 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | සහතික වූ 2021 අංක 10 දළ දේශීය ආදායම් (සංශෝධන) පනතින් ක්‍රියාත්මක කිරීමේ තහවුරු කිරීම් තිබේ. | ලද කැබිනට් තීරණ 5 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| යෝජිත ත්‍රස්තවාදය මැඩපැවැත්වීම පිළිබඳ පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගැනීම | ආවෘත | හෙළිකර නැත | විදේශ අමාත්‍යාංශය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ මෙම තීන්දුවට අදාළ තොරතුරු ලබාගැනීමට ගොනු කරන ලද තොරතුරු ඉල්ලීම යටතේ කිසිදු තොරතුරක් නොලැබුණි. පොරොන්දුවේ ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් වෙබ් පරීක්ෂා මගින් ලබා ගත නොහැකි විය. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 11 වන ස්ථානයට වෙළඳ අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 2 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 2 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| වැවිලි ක්ෂේත්‍රයේ වේතන යෝජනාව ක්‍රියාත්මක කිරීම | ආවෘත | හෙළිකර නැත | වැවිලි අමාත්‍යාංශය |
| | 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ මෙම තීන්දුවට අදාළ තොරතුරු ලබාගැනීමට ගොනු කරන ලද තොරතුරු ඉල්ලීම යටතේ කිසිදු තොරතුරක් නොලැබුණි. පොරොන්දුවේ ප්‍රගතිය පිළිබඳ කිසිදු තොරතුරක් වෙබ් පරීක්ෂා මගින් ලබා ගත නොහැකි විය. | පොරොන්දුවේ ප්‍රගතිය ඇගයීමට තොරතුරු නැත. | වැවිලි අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 19 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන හයෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 0 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | | ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| කොළඹ වරාය නගරයේ වෙක් පෝට් සිටි කළම්බු (පුද්ගලික) සමාගම මඟින් යෝජිත ආයෝජනයට ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති තත්ත්වය ලබා දීම සහ දිරි දීමනා ලබා දීම | විවෘත | සම්පූර්ණව ක්‍රියාත්මක ක ර ඇත | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය |
| | මෙම තීන්දුවට අදාළ තොරතුරු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි ඇති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින්ල බා ගන්නා ලදී. | කොළඹ වරාය නගරය උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනා ගත් මුදල් ඇමති 2020 නොවැම්බර් 24 දින අතිවිශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කළේය. මෙම පනතේ 3 වන වගන්තිය, 2 (3) උප වගන්තිය හරහා මෙය සාක්ෂාත් කරගනී. | නාගරික සංවර්ධන අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 13 වන ස්ථානය ලබා ගත් රාජ්‍ය ආයතන පහෙන් එකකි. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 1 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 1 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |
| සුරාබදු ආඥාපනත (52 වන අධිකාරය) යටතේ අති විශෙෂ ගැසට් නිවේදන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම | විවෘත | සම්පූර්ණව ක්‍රියාත්මක ක ර ඇත | මුදල් අමාත්‍යාංශය |
| | මෙම තීන්දුවට අදාළ අති විශේෂ ගැසට් පත්‍ර පිළිබඳ තොරතුරු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබා ගැනිණි. මීට අමතරව, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන මෙම ගැසට් නිවේදන පිළිබඳ තොරතුරු පාර්ලිමේන්තු හැන්සාඩ් හරහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකි විය. | 2020 සැප්තැම්බර් 10 දින අතිවිශේෂ ගැසට් නිවේදන 2152/11, 2152/12 සහ 2152/13 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණි. | 2020 දී ඇගයීමට ලක් කරන ලද රාජ්‍ය ආයතන 24 න් 3 වන ස්ථානයට මුදල් අමාත්‍යාංශය පත්විය. අමාත්‍යාංශයට ලැබුණු සරල සාමාන්‍ය ලකුණු 3.40 මත පදනම්ව ශ්‍රේණිගත කිරීම තීරණය කරන ලදි (විවෘතභාවයේ මට්ටමට සම්බන්ධ සරල සාමාන්‍යය මත පදනම්ව). මෙම අගය පදනම් වූයේ අමාත්‍යාංශයේ විෂය |

| යෝජනාව | විවෘතභාවය | ප්‍රගතිය | නියෝජිත ශ්‍රේණිගත කිරීම |
|---|---|---|---|
| | | | පථයට අයත් 2020 දී ඇගයීමට ලක් කරන ලද කැබිනට් තීරණ 5 ක තොරතුරු අනාවරණය කිරීම මත ය. |

**වගකීම්හරණය**

**මෙම වෙබ් අඩවියෙහි අන්තර්ගත වන තොරතුරු ලබා ගනු ලබන්නේ රජයේ වාර්තා, නිල ප්‍රකාශන, ප්‍රසිද්ධ වාර්තා, සහ තොරතුරු දැනගැනීමේ පණත යටතේ ලබාගත් තොරතුරු යනාදිය වෙතිනි. තවද, මෙම වෙබ් අඩවියේ පළ කරනු ලබන තොරතුරු කිසිවක් කිසිදු ආකාරයකින් වෙරිටේ රිසර්ච් ආයතනයේ හෝ එහි සාමාජිකයන්ගේ පෞද්ගලික අදහස් යැයි අර්ථකථනය කළ නොහැක. එමෙන්ම මෙම වෙබ් අඩවියේ ඇති යම් තොරතුරක ප්‍රතිඵලයක් ලෙසින් කිසියම් කෙනෙකු අප්‍රසිද්ධියට හෝ අපකීර්තියට පත්වුවහොත් එයට වෙරිටේ රිසර්ච් මොනයම් ආකාරයකින් හෝ වග කියනු නොලැබේ.**

**අපගේ වෙබ් අඩවිය සඳහා හැකිතාක් විශ්වාසදායී තොරතුරු ලබා ගැනීමට උපරිම ලෙස ක්‍රියාකළද, මෙම රැස් කරගත් තොරතුරුවල තිබිය හැකි අක්‍රමිකතා හෝ අතපසුවීම් නිසා එම තොරතුරු භාවිතයෙන් උද්ගත විය හැකි ගැටලුවලට වෙරිටේ රිසර්ච් හෝ BudgetPromises.org වෙබ් අඩවියේ ක්‍රියාකාරීන් වග කියනු නොලැබේ.**

**එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව අප විසින් ප්‍රකාශයට පත් කරනු ලබන තොරතුරු වෙනස් කිරීමට, අන් තැනෙක ප්‍රකාශ කිරීමට, සම්ප්‍රේෂණය කිරීමට, හුවමාරු කිරීමට, විකිණීමට, ප්‍රතිනිර්මාණය කිරීමට, බෙදා හැරීමට, නැවත පළ කිරීමට, අභිවහනය කිරීමට, ප්‍රදර්ශනය කිරීමට හෝ කිසිදු වාණිජමය අරමුණකින් අපයෝජනය කිරීමට කිසිවෙකුට කිසිසේත් හිමිකම් නැත. එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනයේ අනුමැතිය සහිතව හෝ රහිතව BudgetPromises.org හි තොරතුරු භාවිතා කිරීමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාකවලටද අපි වග නොකියමු.**

**වෙරිටේ රිසර්ච් ආයතනය කිසිදු දේශපාලන පක්ෂයක් සහ/හෝ දේශපාලන අරමුණු ඇති සංවිධානයකට සහය හෝ අනුමැතිය නොදක්වන අතර එවැනි කිසිවක් වෙනුවෙන් පෙනී සිටීම හෝ නියෝජනය කිරීම ද නොකරයි.**

**මෙම වෙබ් අඩවියේ සඳහන් වන තොරතුරු මහජනයා අතර දැනුවත්භාවය නංවාලනු වස් කිසිදු අයකිරීමකින් තොරව සපයනු ලැබේ. එමෙන්ම වෙරිටේ රිසර්ච් ආයතනය හෝ BudgetPromises.org කණ්ඩායම කිසිදු පාර්ශවයක් සමඟ මෙම වෙබ් අඩවියේ සඳහන් තොරතුරු ලබාදීමට කිසිදු ගිවිසුමකට හෝ අවබෝධතාවකට එළඹ නැත.**

**මෙම වෙබ් අඩවියට ඇතුලත් වන්නේ budgetpromises.org විසින් විශ්ලේෂණය කර සම්පාදනය කරන ලද ස්වාධීන විශ්ලේෂණයන්හි ප්‍රතිඵල වන අතර එමඟින් දත්ත වල පවතින ප්‍රවණතාවයන් සහ හැසිරීම ඉදිරිපත් කර ඇත. එම තොරතුරුවලින් කිසිවක්, කිසිවකු විසින් ප්‍රතිඋත්පාදනය කරන්නට අදහස් කරන්නේනම් වෙරිටේ රිසර්ච් ආයතනයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.**